# අභයගිරි විහාර සංකීර්ණයෙන් හමුවී ඇති පැරණි කාසි හා ඒවායේ ඇති සංකේත

කේ.සී.ඩී. දිල්රුක්ෂි කුමාරි[1], ආර්.එම්. සංකල්පනි මදුෂිකා[2]

නාණක මූලාශ්‍රය යනු සාහිත්‍යගත මූලාශ්‍රවලින් හෙලිවන සාධක තහවුරුකර ගැනීමට භාවිත කළ මූලාශ්‍රයකි. ලක්දිව දේශියව නිපදවා ඇති කාසි, විදේශීය කාසි මෙන්ම ව්‍යාජ කාසි ද අභයගිරිය තුළින් හමුවේ. එලෙස අභයගිරි විහාර සංකීර්ණයෙන් හමුවන කාසි තුළින් වටිනාකම, නිෂ්පාදිත අමුද්‍රව්‍ය ආදි ලක්ෂණයන්ට අමතරව සංකේත ලෙස සූර්ය සලකුණ, තිත් සලකුණ, ඇත් සලකුණ, ස්වාභාවික වස්තු, සත්ත්ව රූප, දේව රූප, ආයුධ හෝ උපකරණ, කඳු සලකුණ, අඩකව දෙක, ත්‍රිරත්නය හා අඩසඳ නිරූපිතය. ලක්දිව භාවිත පැරණිම කාසි නිෂ්පාදිත කම්හලක් අභයගිරියෙන් සොයාගෙන තිබේ. හස්එබු, කහාපණ, ඇතා සහ ස්වස්තික කාසි, ශ්‍රී ලක්ෂ්මි කාසි, වෘෂභ කාසි, සිංහ කාසි හා විදේශීය කාසි අභයගිරි කැණීම් තුළින් හමුවී තිබේ. එම කාසි තුළ සංකේතයන්හි විවිධත්වයක් පෙන්නුම් කරයි. හස්එබු කාසිවල ඇති සංකේත ලෙස සූර්ය සලකුණ, තිත් සලකුණු, ඇත් සලකුණ, කඳු සලකුණ, අඩකව දෙක, ත්‍රිරත්නය, අඩ සඳ, යන සංකේත හඳුනාගත හැකි වේ. ඇතා සහ ස්වස්ථික කාසියේ අභිමුඛය තුළ බෞද්ධ ස්වස්තිකය, ඇත් සලකුණ, කඳු සලකුණ, තිත් තුන, වෘක්ෂය, ත්‍රිකොණ සංකේත දැකිය හැකිය. ප්‍රතිමුඛය තුළ බෞද්ධ ස්වස්ථිකය, ත්‍රිකොණ සංකේතය, තිත් තුන, කඳු සලකුණු වේ. මෙහි ස්වස්ථිකය තනිව නොයෙදි රේක්කය වැනි කොටසකින් සංයුක්ත වී සැදි තිබේ. ලක්ෂ්මි කාසිය අභිමුඛයේ හිටගෙන හා හිඳගෙන සිටින ලක්ෂ්මි රූපද ඇත. ලක්ෂ්මි දෙවගන සියලු ආභරණයන්ගෙන් සැරසී නෙලුම් දණ්ඩක් මත සිටින අතර නෙලුම් මල් දෙකක් මත සිටින සොඬින් කළ ගත් ඇතුන් යුවලක් දේවියගේ හිස අභිෂේක කරනු ලබයි. දේවියගේ හිස වටා රශ්මි මාලාවක් හා වේදියක් සහිත ස්වස්ථික සලකුණ ද දැක්වේ. සිංහ කාසියෙහි කේසර රුව සහිතව සිංහ රුව වමට ද ඇතැම් කාසිවල දකුණට ද සිටින ආකාරය දැක්වේ. ප්‍රතිමුඛය තුළ රේකාමය කවයක් තුළ තිත් සලකුණු 04 ක් ඇතුළත්ය. වෘෂභ කාසියෙහි අභිමුඛයේ වමට හෝ දකුණට හැරී සිටගෙන සිටින ගව රුවක් ද ගවයා ඉදිරියේ භාජනයක් වේ. මෙහි ගව රුව රේඛාවකින් වට වී ඇත. එම රේඛාවට සමාන්තරව ඊට පිටතින් තිත් පෙළකි. අනෙක් පස සතරැස් රේඛා හා තිත් සලකුණු ඇත. රන් කහවනුවෙහි අභිමුඛයේ නෙලුම් දණ්ඩක් මත සිටගෙන සිටින රුවක් ද එහි වම් අත්ල මත පද්ම සලකුණ ද ප්‍රතිමුඛයෙහි හිඳගෙන සිටින මිනිස් රුවක් ද එම රුවෙහි වම් අත්ල මත සංඛ රූපය ද දැක්වේ. මෙම කාසිවල අන්තර්ගත සංකේත තුළින් එකල ජනයා සාමාජීය මතවාද ඉස්මතු කර දක්වන්නට ඇත. නමුත් උක්ත කරුණුවලින් ගම්‍ය වනුයේ එම සමාජය උසස් තාක්ෂණයෙන්, කලාවෙන් සමෘද්ධිමත් කාලපරිච්ඡේදයකට උරුමකම් කියූ බවය.

ප්‍රමුඛ පද : කාසි, සංකේත, අභිමුඛය, ප්‍රතිමුඛය

---

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
wickramasighedilrukshi@gmail.com